OL/2025(2026)/61/S I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | S | I, II**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| පත්‍රය 1 | |
| පත්‍රය 2 | |
| EMF | |

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## භූගෝල විද්‍යාව I

විභාග අංකය: ..........................

**උපදෙස්:**
* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **හිස් ඉර මත ලියන්න.**

1. පෘථිවි වායුගෝලයේ සංයුතිය අනුව එහි වැඩිපුරම අන්තර්ගතව ඇත්තේ ....නයිට්‍රජන්.... වායුව ය.
(කාබන්ඩයොක්සයිඩ් / ඔක්සිජන් / නයිට්‍රජන්)

2. පෘථිවියේ ජල ව්‍යාප්තිය අනුව ගංගා, ඇළ දොළ, විල් හා ජලාශවල ඇති ජලය ....භූතල.... ජලය ලෙස හැඳින්වේ.
(භූතල / භූගත / පාංශු)

3. ලෝකයේ වාර්ෂික මිනිරන් නිෂ්පාදනයෙන් 60% ක් පමණ ....ඉන්දියාව.... විසින් නිපදවයි.
(ශ්‍රී ලංකාව / මැඩගස්කරය / ඉන්දියාව)

4. ශ්‍රී ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිතයක් ලෙස ....යාල.... සැලකේ.
(සිංහරාජ / යාල / විල්පත්තු)

5. ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් ....65%.... පමණ ජනහීන ප්‍රදේශ වේ.
(25% / 65% / 75%)

● අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

6. පැපුවා නිව්ගිනියා සහ ටස්මේනියා යන දූපත් පිහිටා ඇත්තේ ඕස්ට්‍රේලියා මහාද්වීප තටකය තුළ ය. (නි) / වැ

7. ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයක් වූ 'සැක්‍රමැන්ටෝ' ගංගා නිම්නය ඕස්ට්‍රේලියාවේ පිහිටා ඇත. නි / (වැ)

8. තරඟකාරී වෙළෙඳපොළ සඳහා දරනු ලබන ප්‍රචාරණ වියදම් හේතුවෙන් නිෂ්පාදිත භාණ්ඩවල මිල පහළ මට්ටමක රඳවා ගැනීමට නිෂ්පාදකයන්ට හැකි වී ඇත. නි / (වැ)

9. ශ්‍රී ලංකාවේ පිඟන්මැටි ආශ්‍රිත නිෂ්පාදනවල දේශීය අලෙවියෙන් වැඩිම ආදායමක් උපයා ගනු ලබන්නේ පිඟන් ගඩොල් හා සනීපාරක්ෂක කට්ටල අලෙවිය මගිනි. (නි) / වැ

10. නායයෑම් සහ ජල ගැලීම් වැනි ස්වභාවික උපද්‍රව මානව ක්‍රියාකාරකම් නිසා තීව්‍රවන උපද්‍රව ලෙස හැඳින්විය හැකි ය. (නි) / වැ

● අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. ශ්‍රී ලංකාවේ තෙදකර බිම්වල වී වගාව කෙරෙනුයේ ....හෙල්මළු.... වගා ක්‍රමයට අනුව ය.

12. ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ අපනයන අතුරෙන් වැඩිම විදේශ විනිමයක් උපයනු ලබන්නේ ....රෙදිපිළි හා ඇඟලුම් / ඇඟලුම්.... අපනයනය මගිනි.

Past Papers Wiki



13. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා යන අංශ තුන අතුරෙන් ශ්‍රම බලකායෙන් වැඩිම පිරිසක් රැකියාවල නිරතව ඇත්තේ ......සේවා...... අංශයෙහි ය.

14. පෘථිවි අභ්‍යන්තරයේ දී මැග්මා සිසිල් වී ඝනවීමෙන් ......ආක්‍රාන්ත...... ආග්නේය පාෂාණ නිර්මාණය වේ.

15. උතුරු අත්ලාන්තික් සාගර ප්‍රදේශයේ හටගන්නා වාසුළි ......හරිකේන්...... නමින් හඳුන්වනු ලැබේ.

16. ගංගාවක් ......මොහොර/ ප්‍රපාතාකාර...... බෑවුමක් ඔස්සේ ගලා බසින විට දිය ඇල්ලක් නිර්මාණය වේ.

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

**ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා සාමාන්‍ය වර්ධන අනුපාතිකය - 1871-2024 සංගණන වර්ෂ සඳහා**




17. ජන සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 15 දක්වා වර්ධනය වූයේ ......1971...... සංගණන වර්ෂයේ දී ය.

18. ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකයේ උපරිමය දැක්වෙන්නේ ......1953...... සංගණන වර්ෂයේ දී ය.

19. මෑත භාගය තුළ ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකයේ කැපීපෙනෙන ලක්ෂණය වන්නේ එහි සීඝ්‍ර ......අඩුවීම/ පහත වැටීම...... යි.

- අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| 'අ' කඳුවැටිය | 'ආ' පිහිටි මහාද්වීපය |
|---|---|
| 1. මහා බෙදුම් කඳු | A - ආසියාව |
| 2. ඇට්ලස් කඳු | B - දකුණු ඇමෙරිකාව |
| 3. ඇන්ඩීස් කඳු | C - අප්‍රිකාව |
| | D - ඕස්ට්‍රේලියාව |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, B (...4...)

21.

| 'අ' යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන | 'ආ' පිහිටා ඇති රට |
|---|---|
| 1. දකුණු මැංචූරියා | A - ඇමෙරිකා එක්සත් ජනපදය |
| 2. බර්මින්හැම් | B - එක්සත් රාජධානිය |
| 3. පිට්ස්බර්ග් | C - චීනය |
| | D - ඉන්දියාව |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, C, B (...3...)

**22.**

| 'අ' | 'ආ' |
|---|---|
| **ව්‍යාප්ති ප්‍රදේශය** | **ඛනිජ වර්ගය** |
| 1. බෝගල | A - ඉල්මනයිට් |
| 2. බොරලැස්ගමුව | B - මිනිරන් |
| 3. ඇළහැර | C - කෙඔලින් |
| | D - මැණික් |

1953

(1) A, B, C (2) B, C, D (3) C, B, D (4) D, B, A (..2..)

**23.**

| 'අ' | 'ආ' |
|---|---|
| **පාෂාණ වර්ගය** | **ප්‍රයෝජන** |
| 1. නයිස් | A - ගොඩනැගිලි හා මහා මාර්ග ඉදිකිරීම, ප්‍රතිමා නෙළීම |
| 2. ඩොලමයිට් | B - පොහොර නිෂ්පාදනය, අළු හුණු නිෂ්පාදනය |
| 3. මයෝසීන හුණුගල් | C - සිමෙන්ති නිෂ්පාදනය, යපස් උණු කිරීම |
| | D - පිඟන් ගඩොල් නිෂ්පාදනය |

(1) A, B, C (2) B, C, D (3) C, D, B (4) D, A, B (..1..)

**24.**

| 'අ' | 'ආ' |
|---|---|
| **වනාන්තර වර්ගය** | **විශේෂ ලක්ෂණ** |
| 1. නිවර්තන තෙත් | A - ගස්මුදුන් වියනක් සේ සෑදී ඇත. ගස්වල අපිශාක බහුලය. සපු, කීන, වල්දෙල් වැනි ගස් වර්ග බහුලය. |
| 2. වියළි මිශ්‍ර සදාහරිත | B - නියඟයට ඔරොත්තු දෙන ශාක බහුලය. පලු, වීර, එරමිණියා, කරඹ වැනි ගස් වර්ග බහුල ය. |
| 3. කටු පඳුරු හා ළඳු කැලෑ | C - වියන් ස්තර ගණනාවකි. ඝන යටි රෝපණයකින් සමන්විත වේ. තද කොළ පැහැති වනාන්තර වේ. |
| | D - වියළි කාලයේ දී කොළ හැලේ. වර්ෂා සෘතුවේ දී ශාක වර්ධනය සිදුවේ. කලුවර, මිල්ල, තේක්ක වැනි ගස් බහුලය. |

(1) A, B, C (2) B, C, D (3) C, D, B (4) D, A, C (..3..)

- අංක 25 සිට 37 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** ආසියාවේ වී වගා කෙරෙන ප්‍රදේශ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බොහෝ ආසියානු රටවල ශ්‍රම සූක්ෂම වගාවක් ලෙස වී වගාව සිදුකෙරේ.
(2) ආසියානු රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොවිබිම්වල වී වගාව සිදු කෙරේ.
(3) ආසියානු රටවල වී වගාව මුළුමනින්ම යාන්ත්‍රීකරණය වී ඇත.
(4) ආසියානු රටවල නිෂ්පාදනය කෙරෙන සහල් සඳහා ලොව පුරා පැතිරුණ වෙළෙඳපොලක් නිර්මාණය වී ඇත. (..1..)

**26.** පහතරට තේ වගාකරන දිස්ත්‍රික්කයක් වන්නේ,
(1) කෑගල්ල (2) මාතලේ (3) මහනුවර (4) මොණරාගල (..1..)

**27.** ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීමට උපකාර කිරීම සඳහා කිරිගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ස්ථානය කුමක් ද?
(1) අඹේවෙල (2) කනන්විල
(3) වල්පිට (4) මීවනපලාන (..4..)

**28.** රබර් වගාව සඳහා සුදුසුම පස් වර්ගය කුමක් ද?
(1) රතු දුඹුරු පස (2) රතු කහ ලැටසෝල් පස
(3) කබොක් මිශ්‍ර රතු පස (4) චූර්ණමය නොවූ දුඹුරු පස (..3..)

**29.** ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික බෝග වගාවන් සඳහා යොදා ඇති බිම් ප්‍රමාණයෙන් වැඩිම බිම් කොටසක් අයත් වන්නේ මින් කුමන වගාවට ද?
(1) තේ (2) රබර්
(3) පොල් (4) සුළු අපනයන බෝග (..3..)

**30.** ලෝකයේ විද්‍යුත් උපාංග නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට වර්තමානයේ පත්ව ඇති රට
(1) ජපානයයි. (2) චීනයයි.
(3) ඉන්දියාවයි. (4) දකුණු කොරියාවයි. (..2..)

31. ශ්‍රී ලංකාවේ ජල විදුලි බලාගාර සහ ඒ හා සම්බන්ධ ගංගා දක්වා ඇති යුගල අතුරෙන් **නොගැළපෙන** වරණය තෝරන්න.
(1) සමනල වැව - වලවේ ගඟ
(2) කැනියොන් - කළු ගඟ
(3) කොත්මලේ - මහවැලි ගඟ
(4) ඉඟිනියාගල - ගල්ඔය
(..2..)

32. ලෝකයේ රටවල් අතුරෙන් වැඩිම ජන සංඛ්‍යා වර්ධන වේගය සහ අඩුම ජනසංඛ්‍යා වර්ධන වේගය ඇති රටවල් දෙක පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඉන්දියාව සහ රුසියාව
(2) බංග්ලාදේශය සහ ඇමෙරිකා එක්සත් ජනපදය
(3) පකිස්තානය සහ චීනය
(4) නයිජීරියාව සහ ජපානය
(..4..)

33. වර්තමාන ලෝක ජනසංඛ්‍යාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) ලෝක ජනසංඛ්‍යාව බිලියන අටට අධික ය.
(2) වැඩිම ජනසංඛ්‍යාවක් වාසය කරන රට චීනයයි.
(3) සංවර්ධිත රටවල ජනසංඛ්‍යා වර්ධන වේගය ඉහළ ය.
(4) වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන මහාද්වීපය යුරෝපයයි.
(..1..)

34. මානව සංවර්ධන දර්ශකය අනුව ශ්‍රී ලංකාව අයත් වන්නේ මින් කුමන රටවල් කාණ්ඩයට ද?
(1) ඉතා ඉහළ මානව සංවර්ධනයක් ඇති රටවල්
(2) ඉහළ මානව සංවර්ධනයක් ඇති රටවල්
(3) මධ්‍යස්ථ මානව සංවර්ධනයක් ඇති රටවල්
(4) පහළ මානව සංවර්ධනයක් ඇති රටවල්
(..2..)

35. ශ්‍රී ලංකාවට අකුණු සැර උපද්‍රව බහුලව බලපාන කාලසීමාව මින් කුමක් ද?
(1) චාසුළි වර්ෂාව ලැබෙන කාලසීමාව
(2) නිරිත දිග මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව
(3) ඊසාන දිග මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව
(4) අන්තර් මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව
(..4..)

36. දේශගුණික වෙනස්කම් හට ගැනීම කෙරෙහි බලපාන මූලිකම සාධකය වන්නේ,
(1) ගෝලීය සුළං රටාවේ වෙනස්වීම ය.
(2) හරිතාගාර ආවරණයයි.
(3) සූර්ය ලප හටගැනීමයි.
(4) ගෝලීය උණුසුම ඉහළ යාමයි.
(..4..)

37. රටක වාර්ෂික, ආගමික සහ අපනයන සංයුතිය වැනි දත්ත නිරූපණය කිරීම සඳහා සුදුසුම ප්‍රස්තාර වර්ගය වන්නේ,
(1) බෙදූ වෘත්ත ප්‍රස්තාරය
(2) සරළ තීරු ප්‍රස්තාරය
(3) ද්විත්ව තීරු ප්‍රස්තාරය
(4) බහු තීරු ප්‍රස්තාරය
(..1..)

- පහත **A, B, C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. නාගරීකරණය
2. පාරිසරික ගැටලු

**B** - 1. වාසුළි ක්‍රියාකාරිත්වය
2. දේශගුණික විපර්යාසය

**C** - 1. අසම ජන ව්‍යාප්තිය
2. යටිතල පහසුකම්

**D** - 1. බාල වයස් ජනසංඛ්‍යාව
2. ශ්‍රම බලකාය

38. පළමුවැන්න හා සම්බන්ධ ගැටලු අවම කිරීමට දෙවැන්නේ වර්ධනය හේතු වේ යයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D
(..3..)

39. දෙවැන්න හා සම්බන්ධ ගැටලු ඇතිවීමට පළමුවැන්නේ අඩුවීම හේතු විය හැකි බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D
(..4..)

40. පළමුවැන්නේ වර්ධනය දෙවැන්නේ ද වර්ධනයට හේතු වේ යයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D
(..1..)

/4

❋ ❋

# භූගෝල විද්‍යාව

## II පත්‍රය

**01 - ඉගෙනුම් පල :**

1. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන පිහිටීම, දිශාව, පරිමාණය හා සූචකය ඇතුළු පර්යන්ත තොරතුරු හඳුනාගෙන අර්ථ දක්වයි.
2. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන ප්‍රධාන භෞතික ලක්ෂණ හඳුනාගෙන නම් කරයි.
3. 1:50000 සිතියම්වල සම්මත ලකුණු හා සංකේත මගින් දක්වා ඇති සංස්කෘතික ලක්ෂණ නම් කරයි.
4. 1:50000 සිතියම්වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි.
5. ලෝකයේ හා ලංකාවේ ආකෘති සිතියම්වල ලකුණු කර දක්වා ඇති ස්ථානවල නිවැරදි පිහිටීම නම් කරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025 (2026)

විභාග අංකය / சுட்டெண் / Index Number ..........................................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

| පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only |
|---|

1. (අ) (அ) (a)

(i) ජාල උතුර — 1

(ii) බණ්ඩාංක — 1

(iii) ජල කපොල්ල — 1

(iv) දිස්ත්‍රික්ක — 1

(v) 01 $km^2$ — 1

(vi) දුම්රිය ස්ථානය/ දුම්රිය පොල — 1

පාසල — 1

(vii) නි — 1

(viii) වැ — 1

(ix) නි — 1

10/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය ලෝක සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ජැමෙයිකා දූපත - Ⓐ, Ⓑ, Ⓒ

(ii) පැම්පාස් තණබිම - Ⓓ, Ⓔ, Ⓕ

(iii) නයිජීරියාව - Ⓖ, Ⓗ, Ⓘ

(iv) සිඩ්නි නගරය - Ⓙ, Ⓚ, Ⓛ

(v) කැම්චැට්කා අර්ධද්වීපය - Ⓡ, Ⓢ, Ⓣ (ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) මධුපාර අභය භූමිය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) නිලාවේලි - Ⓓ, Ⓔ, Ⓕ

(iii) මඩකලපුව - Ⓖ, Ⓗ, Ⓘ

(iv) නිල්වලා ගඟ - Ⓙ, Ⓚ, Ⓛ

(v) හෝර්ටන් තැන්න - Ⓡ, Ⓢ, Ⓣ (ලකුණු 05 යි)

(ආ) /(ஆ) /(b)




(i) A

(ii) F

(iii) H

(iv) K

(v) S

/ 5

(ඉ) /(இ) /(c)




(i) B

(ii) D

(iii) H

(iv) K

(v) T

/ 5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

| | | | | |
|---|---|---|---|---|
| 1. | (අ) (அ) (a) $\frac{}{10}$ | (ආ) (ஆ) (b) $\frac{}{5}$ | (ඉ) (இ) (c) $\frac{}{5}$ | = $\frac{}{20}$ |

**02 - ඉගෙනුම් පල ,**

1. පෘථිවි ව්‍යුහය අනුව වෙදී ඇති ස්තර ඒවායේ සංයුතිය හා ගති ලක්ෂණ අනුව නම් කරයි.
2. ශිලා ගෝලය නිර්මාණය වී ඇති ප්‍රධාන භූතැටි නම් කරයි.
3. ශිලා ගෝලය හා පෘථිවි අභ්‍යන්තරය අතර හටගන්නා අන්තර් ක්‍රියාකාරිත්වය මිනිස් කටයුතුවලට අහිතකර ලෙස බලපාන ආකාරය විස්තර කරයි.

**II කොටස**

**2.** (i) පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්තර දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් බැගින් පහත (a) හා (b) යටතේ දක්වා ඇත.

(a) පෘථිවි අභ්‍යන්තරයේ පිහිටා ඇත. ද්‍රවමය ලෝහ හා ඝන ලෝහවලින් සමන්විත වේ.

(b) ප්‍රයෝජනවත් ඛනිජ වර්ග අන්තර්ගත වේ. මෙම ස්තරයේ ඝනකම මහාද්වීපවලදී 60 km පමණ ද සාගරවලදී 5 km පමණ ද වේ.

එම ස්තර **දෙක** මොනවාදැයි (a), (b) අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශිලාගෝලය නිර්මාණය වී ඇති විශාල භූ තැටි අතරින් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශිලාගෝලය හා පෘථිවි අභ්‍යන්තරය අතර හටගන්නා අන්තර්ක්‍රියාකාරිත්වය මිනිස් කටයුතුවලට අහිතකර ලෙස බලපාන අවස්ථා **තුනක්** සඳහන් කර ඉන් එක් අවස්ථාවක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

i.

a) A - හරය

b) B - කබොල

**(1 + 1 = ලකුණු 02)**

ii.

1) යුරේසියානු තැටිය
2) ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය
3) අප්‍රිකානු තැටිය
4) උතුරු ඇමරිකානු තැටිය
5) දකුණු ඇමරිකානු තැටිය
6) පැසිපික් තැටිය
7) ඇන්ටාර්ක්ටික් තැටිය

**(මින් තුනක් නම් කිරීමට ලකුණු 1 x 3 = ලකුණු 03)**

iii.

1) භූමිකම්පා හට ගැනීම
2) සුනාමි හට ගැනීම
3) ගිනිකඳු විදාරණය

} අවස්ථා

අහිතකර බලපෑම්

(1)

1. ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශවීම හා ආපදාවට ලක්වීම
2. මහා පරිමාණයෙන් දේපල විනාශ වීම
3. සංවර්ධන කටයුතු අඩපන වීම
4. විශාල පිරිසක් අවතැන් වීම
5. යටිතල පහසුකම් විනාශ වීම

6. පාරිසරික ගැටලු

(2)

1. වෙරළබඩ ජනාවාස, කම්හල්, සංචාරක හෝටල්, වරායවල් විනාශ වීම
2. ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශ වීම
3. වෙරළ බඩ ප්‍රදේශවල භෞතික හා මානව භූදර්ශනය විනාශ වීම
4. ධීවර කටයුතුවලට හානි සිදුවීම
5. වසංගත රෝග ව්‍යාප්තිය
6. ජනතාව විතැන්වීම හා දිවිගලවාගත් අයගේ මානසික පීඩා

(3)

1. විශාල වශයෙන් ජීවිත හානි සිදුවීම
2. ජන ජීවිතයට සිදුවන බාධා නිසා විශාල පිරිසක් අවතැන් වීම
3. දේපළ විනාශ වීම
4. යටිතල පහසුකම් විනාශ වීම
5. වගා බිම් විනාශ වීම
6. අළු හා පාෂාණ කොටස් විදාරණය වීමෙන් පරිසර දූෂණය වීම
7. කෙටි කාලීනව ඇතිවන කාලගුණික වෙනස්කම්
8. අළු හා ලාවා කොටස් වායු ගෝලයට මුසු වීම නිසා වායු දූෂණය වීම හා ගුවන් ගමන්වලට බාධා හට ගැනීම
9. පෘථිවි පෘෂ්ඨය මත ලාවා ගැලීම් නිසා ගොඩබිම් ප්‍රදේශ විනාශ වීම

**අවස්ථා තුනක් නම් කිරීමට ලකුණු 03**
**එක් අවස්ථාවක් පැහැදිලි කිරීමට ලකුණු 02**
**ලකුණු 05**

**03 - ඉගෙනුම් පල :**

1. වතු කෘෂිකර්මාන්තයේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි භෝග ආශ්‍රිත ගැටලු හඳුනා ගෙන නම් කරයි.
3. ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.

**3.** (i) වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෝග වර්ග දැනට මුහුණපා ඇති ගැටලු තුනක් පහත (a), (b), (c) යටතේ දක්වා ඇත. ඒ එක් එක් ගැටලුව ප්‍රබල ලෙස බලපා ඇති ප්‍රධාන බෝගය කුමක් දැයි (a), (b), (c) අනුපිළිවෙළින් දක්වන්න.

(a) ඉඩම් කැබලිකර විකිණීම

(b) ඉඩම් ගොඩකිරීම හා වෙනත් කටයුතුවලට යොදා ගැනීම

(c) ගුණාත්මක බවෙන් අඩු නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් කෘෂිකර්මාන්තය වැදගත් වීමට හේතු **තුනක්** සඳහන් කර ඉන් එකක වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(03) i.

- විශාල වතු වශයෙන් ව්‍යාප්තවීම හා ව්‍යාපාරික ස්වභාවයක් ගැනීම
- දේශීය මෙන්ම විදේශීය ශ්‍රමය ද යොදා ගැනීම
- විධිමත් ශ්‍රම සංවිධානයක් යටතේ පුහුණු ශ්‍රමය භාවිත කිරීම
- කෘෂිකාර්මික කටයුත්තක් වුවද කාර්මික ලක්ෂණ ද විද්‍යාමාන වීම
- විදේශ විනිමය උපයන අපනයන බෝග වීම
- බොහෝ රටවල වතු කෘෂිකර්මය විදේශිකයන් විසින් ආරම්භ කර තිබීම
- විශාල වශයෙන් යාන්ත්‍රීකරණය වී තිබීම
- [illegible]

**(මෙවැනි ලක්ෂණ දෙකක් සඳහන් කිරීමට 1 + 1 = ලකුණු 02)**

ii.

a) පොල්/ රබර්
b) වී
c) තේ

**(1 x 3 = ලකුණු 03)**

iii.

- දළ ජාතික නිෂ්පාදිතයට කෘෂිකර්මයේ දායකත්වය ප්‍රබල වීම 11.1%
- අපනයන අදායමෙන් 24% ක් පමණ කෘෂිකර්මයෙන් ලැබෙන බව
- ශ්‍රම බලකායෙන් 31% ක් පමණ කෘෂිකර්මයෙහි නිරත වීම
- ශ්‍රී ලංකාවේ භූමි පරිභෝගයෙන් විශාල කොටසක් කෘෂිකාර්මික භෝග සඳහා යොදවා තිබීම
- ආහාර නිෂ්පාදන හා කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයන මාධ්‍යයක් වීම

**මෙවැනි කරුණු තුනක් සඳහන් කිරීමට ලකුණු 03**
**එක් කරුණක වැදගත්කම පැහැදිලි කිරීමට ලකුණු 02**
**05**

## 04 - ඉගෙනුම් පල :

1. පෘථිවියේ ප්‍රධාන දේශගුණ කලාපවල ව්‍යාප්තිය විස්තර කරයි.
2. ලෝකයේ වනාන්තරවල ව්‍යාප්තිය හා ඒවායේ ලක්ෂණ සවිස්තර කරයි.
3. වන විනාශය ලෝකයේ දේශගුණ වෙනස්කම් හටගැනීම කෙරෙහි බලපාන ආකාරය විස්තර කරයි.

**4.** (i) A - උතුරු අක්ෂාංශ 23 1/2 ° හා දකුණු අක්ෂාංශ 23 1/2 °

B - උතුරු අක්ෂාංශ 23 1/2 ° හා උතුරු අක්ෂාංශ 66 1/2 °

ඉහත A හා B යටතේ දක්වා ඇති එක් එක් අක්ෂාංශ සීමා තුළ ව්‍යාප්තව ඇති ප්‍රධාන දේශගුණ කලාප **දෙක** මොනවාදැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) ඉහත (i) හි ඔබ සඳහන් කළ B දේශගුණ කලාපයෙහි ව්‍යාප්තව ඇති වනාන්තර වර්ගය සඳහන් කරන්න.

(b) එම වනාන්තරවල විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ලෝකයේ දේශගුණික වෙනස්කම් හට ගැනීම කෙරෙහි වන විනාශය බලපාන ආකාරය පිළිබඳ කරුණු **තුනක්** සඳහන් කර ඉන් එකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

04) i.

A - නිවර්තන දේශගුණ කලාපය / නිවර්තන කලාපය / නිවර්තන

B - සෞම්‍ය දේශගුණ කලාපය / සෞම්‍ය කලාපය / සෞම්‍ය

(ලකුණු 1 + 1 = 02)

ii.

(a) සෞම්‍ය කලාපික වනාන්තර/ පතනශිල වනන්තර

(b)

- පතනශිල වෘක්ෂලතා මෙන්ම සදාහරිත වෘක්ෂලතා වර්ග ද දක්නට ලැබේ.
- ජෛව විවිධත්වය අඩුය.
- පැහැදිලි ස්තර නොමැත. පත්‍ර පළල් ය
- ශිශිර ඍතුවේ දී ගස්වල කොළ හැලේ.
- ආර්ථික වශයෙන් වටිනා දැව වර්ග - ඕක්, බීච් බර්ච්, වොල්නට්, මේපල්, එල්ම්, ඩග්ලස් ෆර් වැනි ගස් වර්ග දක්නට ඇත.

((a) 1 (b) 2 = ලකුණු 03)

iii.

- වායුගෝලයට ඇති කරන බලපෑම්
  - පරිසරය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවීම
  - ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවීම
  - වායු දූෂණයට හේතුවක් වීම ප්‍රමාණය ඉක්මවා වායුගෝලයට කාබන්ඩයොක්සයිඩ් වායුව නිකුත්වීම සහ වායුගෝලීය සමතුලිතතාව සඳහා අවශ්‍ය ඔක්සිජන් වායුව නිකුත් කිරීම අඩුවීම වනවිනාශය මගින් සිදුවේ.
- සුළං රටාවට ඇති කරන බලපෑම්
- වර්ෂාපතනයට ඇති කරන බලපෑම්



Past Papers Wiki

(සුළං රටා වෙනස්වීම, නියඟ හටගැනීම, වැසි ලැබෙන කාලසීමා හා වර්ෂාවේ තීව්‍රතාව ආදියෙහි වෙනස්කම් ඇතිවීම වැනි කරුණු කෙරෙහි වනවිනාශය බලපාන බව)

- දේශගුණ මායිම් කලාපවල වෙනස්වීම් හටගැනීම (කාන්තාරකරණය වැනි හේතුවලට වනවිනාශය බලපාන බැවිනි.)

**කරුණු තුන නම් කිරීමට = ලකුණු 03**
**එක් කරුණක් විස්තර කිරීමට = ලකුණු 02**
05

**05 - ඉගෙනුම් පල :**

1. ලෝකයේ නැව් තැනීමේ කර්මාන්ත්‍යට වැදගත් රටවල් නම් කරයි.
2. ප්‍රවාහන මාධ්‍යයක් ලෙස නාවික ප්‍රවාහනයේ වැදගත්කම විස්තර කරයි.
3. ශ්‍රී ලංකාවේ පෙට්‍රෝ රසායන කරර්මාන්තය දියුණු කිරීමේ වාසි හා අවාසි විස්තර කරයි.

**5.** (i) වර්තමානයේ නැව් තැනීමේ කර්මාන්තයට වැදගත් ආසියානු රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රවාහන මාධ්‍යයක් ලෙස නාවික ප්‍රවාහනය වැදගත්වීමට හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ 'පෙට්‍රෝ රසායන කර්මාන්තය' දියුණු කිරීමේ වාසි **දෙකක්** හා අවාසි **එකක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

05)

i.

- චීනය
- දකුණු කොරියාව
- ජපානය

**(මින් රටවල් දෙකක් නම් කිරීමට 1 + 1 = ලකුණු 02)**

ii.

- අඩු වියදමකින් විශාල භාණ්ඩ ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම.
- ආරක්ෂිතව ප්‍රවාහනය කළහැකි වීම.
- ඛනිජ තෙල්, බහාලුම්, වාහන, යන්ත්‍ර සූත්‍ර වැනි බර බාණ්ඩ විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි ප්‍රධානම මාධ්‍යය වීම.
- යුධ කටයුතු, සුඛෝපභෝගී මගී ප්‍රවාහනය, සාගර පර්යේෂණ වැනි විවිධ කටයුතුවලට යොදාගත හැකි වීම.
- ජාත්‍යන්තර සබඳතා පවත්වා ගැනීමේ හැකියාව.

**(මෙවැනි කරුණු තුනක් දැක්වීමට ලකුණු 03)**

iii.

වාසි -

- රටේ ආර්ථික දියුණුව සමඟ පෙට්‍රෝ රසායන නිෂ්පාදන සඳහා ඉල්ලුම ඉහළ යාම.
- විවිධ නිෂ්පාදන රැසක් බිහිවීම හා එමගින් ලැබෙන ආදායම ඉහළ යාම.
- දේශීය වෙළඳපොළ පුළුල්වීම.
- නිෂ්පාදන විවිධාංගීකරණයක් සිදුවීම.
  (ලිහිසි තෙල් වර්ග, විවිධ ප්ලාස්ටික් භාණ්ඩ, රසායනික පොහොර, ඖෂධ වර්ග, සුවඳ විලවුන්, තීන්ත වර්ග, කෘත්‍රිම රබර්, කෘමිනාශක වැනි)

වාසි දෙකක් සඳහන් කිරීම

අවාසි -

- ආනයනික බොරතෙල් ප්‍රමාණය මත අමුද්‍රව්‍ය ලබාගැනීම රඳාපැවතීම.
- තෙල්මිල උච්ඡාවචනය භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල කිරීම.
- නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා නිපදවන භාණ්ඩවල මිල ද ඉහළ යාම.
- ප්‍රාග්ධන හිඟය බලපෑම.
- ආනයනික භාණ්ඩ නිසා වෙළඳපල තරඟකාරීවීම.
- නිෂ්පාදනයේදී හටගන්නා රසායනික අපද්‍රව්‍ය හා භාවිතයෙන් ඉවත්වන අපද්‍රව්‍ය නිසා පරිසර දූෂණයක් හට ගැනීම.

අවාසි එකක් සඳහන් කිරීම

**වාසි දෙක සඳහන් කිරීමට = ලකුණු 02**
**අවාසි එක සඳහන් කිරීමට = ලකුණු 01**
**නිදසුන් දක්වමින් විස්තර කිරීමට = ලකුණු 02**
**05**

**06 - ඉගෙනුම් පල ।**

1. ශ්‍රී ලංකාවේ මෑත කාලීනව ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති නම් කරයි.
2. සංවර්ධන ක්‍රියාවලියේ දී තිරසර සංවර්ධනය කෙරෙහි ලෝකයේ රටවල අවධානය යොමුවීමට හේතු පැහැදිලි කරයි.
3. සංවර්ධන ක්‍රියාවලියේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අත්වන ප්‍රතිලාභ පැහැදිලි කරයි.

6. (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා මෑත කාලීනව වැඩි අවධානයක් යොමු කළ සංවර්ධන ව්‍යාපෘති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) තිරසර සංවර්ධනය කෙරෙහි ලෝකයේ රටවල අවධානය යොමුවීමට බලපෑ හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සංවර්ධන ක්‍රියාවලියේ දී තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම නිසා අත්වන ප්‍රතිලාභ **තුනක්** සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

i.

- අධිවේගී මහාමාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති
  - කොළඹ - මාතර, කොළඹ - කටුනායක, කොළඹ - මහනුවර, කොළඹ - වටරවුම් පාර අධිවේගී මාර්ග ව්‍යාපෘති
  - කොළඹ - යාපනය දුම්රිය මාර්ග නවීකරණ ව්‍යාපෘතිය
- වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන ව්‍යාපෘති
  - මාගම්පුර වරාය ඉදිකිරීම, ඔලුවිල් වරාය, කොළඹ දකුණු වරාය පර්යන්ත ව්‍යාපෘතිය
- වරාය නගර ව්‍යාපෘතිය
- මත්තල ගුවන්තොටපල ඉදිකිරීම, කටුනායක ගුවන්තොටුපල නවීකරණ ව්‍යාපෘතිය, රත්මලාන, පලාලි ගුවන් තොටුපල සංවර්ධනය
- මානුෂ සංවර්ධන ව්‍යාපෘති
  - සෞඛ්‍යය - ග්‍රාමීය රෝහල් වැඩි දියුණු කිරීම, පානීය ජල ව්‍යාපෘති
  - අධ්‍යාපන - උසස් පෙළට තාක්ෂණික විෂයයන් හඳුන්වාදීම
  - පරිගණක පුහුණු ආයතන
  - පාසල් හැර යන්නන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
  - පාසල්වලට නවීන විද්‍යාගාර පහසුකම්
  - විශ්ව විද්‍යාල සංඛ්‍යාව වැඩි කිරීම

**(මෙවැනි ව්‍යාපෘති දෙකක් නම් කිරීම ලකුණු 02)**

ii.

- පරිසර විසංතුලනය වැළැක්වීමට
- පරිසර සමතුලිතතාව රැක ගැනීමට
- ගෝලීය උණුසුම වැඩි වීම
- ස්වාභාවික සම්පත් වේගයෙන් ක්ෂය වීම
- ජෛව සම්පතට හානි සිදුවීම
- විකල්ප සම්පත් සෙවීම.
- ඕසෝන් වියනට හානි සිදුවීම
- දේශගුණ විපර්යාස
- සංවර්ධන ක්‍රියාවලියේ දී පරිසර කළමනාකරණය සහ සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව

**(මෙවැනි හේතු තුනක් සඳහන් කිරීමට 1 x 3 ලකුණු 03)**

iii.

- රට තුළ හා ඉන් පිටත සංචාර දියුණු වීම.
- අධ්‍යාපනය සඳහා විවිධ ප්‍රවේශ බිහිවීම.
- සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහිවීම.
- දැනුම් සම්භාරය පුළුල් වීම මගින් රැකියා අවස්ථා සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීමේ හැකියාව ලැබීම.
- විද්‍යුත් මුදල් පරිහරණ ක්‍රමවේද හරහා මුදල් ගණුදෙනු පහසුවීම හා ආරක්ෂා සහිත වීම.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයට සිදුවන වාසි
- කාලය ඉතිරි වීම.
- e-channeling
- Ticket booking

**ප්‍රතිලාභ තුනක් සඳහන් කිරීමට = ලකුණු 03**
**එකක් පැහැදිලි කිරීමට = ලකුණු 02**
**05**

**07 - ඉගෙනුම් පල :**

1. ශ්‍රී ලංකාවේ භාවිත වන පුනර්ජනනීය බලශක්ති මූලයන් න මකරයි.
2. පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් අත්වන වාසි විස්තර කරයි.
3. ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රචලිත කිරීමට ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරයි.

**7.** (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ භාවිත වන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර භාවිතය මගින් අත්වන වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය හා පෞද්ගලික අංශය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

i.

- ජල විදුලිය
- සුළං බලය
- සූර්ය බලය
- ජෛව ස්කන්ධ

**(මිත් රටවල් දෙකක් නම් කිරීමට 1 + 1 = ලකුණු 02)**

ii.

- පරිසර දූෂණය අවම වීම.
- බල ශක්ති ප්‍රභව ආනයනයට වැයවන විදේශ විනිමය ඉතිරි වීම.
- නොකඩවාම ලබාගත හැකි වීම.
- පාරිභෝගිකයන්ට අඩු පිරිවැයකින් විදුලිය ලබාගත හැකිවීම.
- පාරිභෝගිකයන්ට අතිරේක ආදායම් මාර්ගයක් වීම
- විදුලිය බිඳවැටීම් අවම වීම.
- අනතුරුදායක බව අවම වීම.

PAST PAPERS WIKI

**(මෙවැනි වාසි තුනක් සඳහන් කිරීමට ලකුණු 03)**

iii.

- පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය සඳහා රජය මගින් ණය පහසුකම් ලබාදීම.
- පෞද්ගලික සමාගම් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීම හා ණය පහසුකම් සලසා දීම
- ලංකා විදුලිබල මණ්ඩලය අතිරික්ත බලශක්තිය ගෘහස්ත පාරිභෝගිකයන්ගෙන් මුදල් ගෙවා ලබාගැනීම.
- රජය මගින් විශාල පරිමාණ බලශක්ති ව්‍යාපෘති විදේශාධාර මත ආරම්භ කිරීම. (මන්නාරම තම්බ පවනි සුළං බලාගාර ව්‍යාපෘතිය/ බරුත කන්ද සූර්ය බලාගාරය)
- පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර මගින් නිපදවන විදුලිය රජය මගින් මිල දී ගැනීම.
- දැනට ලංකාවේ ඉදිවන විශාලම සූර්ය බලශක්ති ව්‍යාපෘතිය හම්බන්තොට ඉදිවෙමින් පවතී. ඇමරිකන් ඩොලර් මිලියන 150 ක ව්‍යාපෘතියකි. මෙගාවොට් 150 ක ධාරිතාවකින් යුතු වේ. මුළු ව්‍යාපෘතියේ ධාරිතාව මෙගාවොට් 400 කි. දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

**මෙවැනි ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම**
**නිදසුන් තුනට = ලකුණු 03**
**පැහැදිලි කිරීමට = ලකුණු 02**
**05**

**08 - ඉගෙනුම් පල :**

1. ශ්‍රී ලංකාවට සංචාරකයන් බහුලව පැමිණෙන රටවල් නම් කරයි.
2. ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කොට දී ඇති සංචාරක කලාප නිවැරදිව නම් කරයි.
3. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දියුණුවට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

**8.** (i) ශ්‍රී ලංකාවට සංචාරකයින් වැඩිපුරම පැමිණෙන රටවල් **දෙකක** නම් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) යාබද සිතියමේ Ⓐ, Ⓑ හා Ⓒ මගින් දක්වා ඇති සංචාරක කලාප **තුන** මොනවා දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)




PAST PAPERS WIKI
Past Papers Wiki

i.

- එක්සත් රාජධානිය
- ඉන්දියාව
- චීනය
- රුසියාව
- ජර්මනිය

**(මින් රටවල් දෙකක් නම් කිරීමට = ලකුණු 02)**

ii

A - [illegible]

B - [illegible]

C - [illegible]

(ලකුණු 1 x 3 = ලකුණු 03)

iii

- සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම.
  - ප්‍රවාහනය
  - හෝටල් පහසුකම්
- සංචාරක ආගන්තුක සේවා කටයුතු සඳහා අවශ්‍ය විශේෂ පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාල ඇතුළු ආයතන යොමු කිරීම.
- සංචාරක කර්මාන්තය සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජකයන්ගේ අනුග්‍රහය ලබාදීම
- නව සංචාරක ආකර්ෂණ වර්ධනය කිරීම.
- ඓතිහාසික, සංස්කෘතික හා පාරිසරික සංචාරක ව්‍යාපෘති සංවර්ධනය කිරීම.
- දේශීය පාරම්පරික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීම.

ක්‍රියාමාර්ග තුනක් නම් කිරීම = ලකුණු 03
නිදසුන් දක්වමින් පැහැදිලි කිරීමට = ලකුණු 02
05

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library